

## ඇසළ පොහොය

### ජයසේන කොඩිතුවක්කු

වත්තල - ශ්‍රී ලංකා

ඇසළ මහේ පුරසඳ ලොව එළිය කරන්
සිසිල බෙදයි දසතම බුදු ගුණය අරන්
කියල දෙන ආපට විසිතුරු බුදු සිරිතෙන්
අචල සැදැහැ ගුණ සිත් තුළ වැඩෙන ලෙසින්

දුටු සුබ සිහිනෙ මහමායා බිසව එදා
සුදු ඇත් පැටිය ගෙන නෙළුමක් සොඬින් රදා
පුදු මයි ඇතුල් වුන හැටි කුසතුළට එදා
සිදු හත් කුමරු ගේ පිළිසිඳ ගැන්ම එදා

සතියෙන් ලැබෙන සක්විති රජකම නොබලා
අළුතෙන් උපන් ලරාහුලල පුතු ගැන නොබලා
සසරෙන් එගොඩ වන්නට නිසි මග සොයලා
මැදුරෙන් නික්මුනේ සිදුහත් කලකිරිලා

කෙලෙසුන් නසා බුදු බව ලත් සමිඳාණන්
දිවැසින් දුටුවෙ පිංවත් පස්වග තවුසන්
එළියෙන් ඇසළ පුරසඳ ලොව දිලෙන පැයෙන්
දෙසුමෙන් පළමු ලදම්සකල සැම දුටුවෙ නිවන්

ගිහි කල මව් තුමිය මායා දේවියට
සිහි කර වැඩියෙ දෙව් ලොව දම් දෙසන්නට
අබි දම් දෙසුම බුදු හිමි නිම කරන විට
හැකි විය ඇයට අරිහත් බව ලබන්නට

මහ සෑ රුවන් වැලියේ වැඩ ඇරඹු දින
සිරි දළදා සමිඳු සිරිලක වැඩිය දින
තව තව බොදු දනන් සිහි කර ගරු කරන
පෙළහර රැසකි ඉතිහාසයෙ අප දකින

## ඩී බී ගුණ සුවඳ

### ජගත් වෙත්තසිංහ

දෙස බස රැසට පළකොට නිබඳවම පෙම
මුතු හර රැගෙන සැරසූ සරසවිය ළැම
සුරපුර රැගෙන සාහිත කරුවකුගෙ නම
ගුවනට ඇදෙයි අද ඩීබී සුවඳ දුම

පන්හිඳ ගැටුණ හැමදේමත් හරබරය
ඔබ බිහි කළේ මහ ලේඛක පිරිවරය
සඳ බස ගියා දැන් අඳුරැයි පරිසරය
පාලුයි ඉතින් අද මෙල්බන් පුරවරය

ඔබ පිරිවැරුව පිරිවර ඔබෙ වියෝවෙන්
රස පත්ඉරුව ගැන විමසන නිසාවෙනේ
බව සැරිසැරුව පසු මතු දින දයාවෙනේ
මහගත්කරුව යළි එනු මැන පියාණනේ

## ඔබ ගිය පසු

### ඩේසි ද සිල්වා



කතුවරයාණනි පිරිපුන් මනසින් පොත් ගුල අප වෙත තිළිණ කළේ
සතු තම හැඟුමන් වපුරා පරපුර පොෂණයෙන් සේවයකි කළේ
අතු අග පිම්මෙන් නොතිරයි බවයේ ඒකයි ගමනක් නතර කළේ
මතු යම් දිනයක ඉපදෙන්නට යළි පතනෙම් නිවනේ සුව සිහිලේ

භාෂා දැනුමයි කථිකත්වය ළඟ පඬිවරයෙකි නැත කුමට කතා
කිව යුතු දෙය ඒ ලෙසම කියාදුනි එඩිතර ගති ඇති සිහල පුතා
සිය දහසක් මල් ඔබට පුදන්නෙම් පන්හිඳ අතරෙන් හැඬට ගොතා
සමුදෙන්නෙම් සමු ගන්නට බැරිමුත් ලේඛක සංහිඳ රකිනු සිතා

ඔබ ලියු පොත්වල අකුරැ නොමැත හිග ඔබ ගුණ කථනය කරන්නට
සබකෝලය පලවා හැර ඈතට දැනුම පෙරටුගාට ලියන්නට
බැබලෙන නාමය කිසිදින නොමැකේ ඔබට නිවන් සුව පතන්නට
සැබෑ පුතෙක් ලොව සැමට අහිමි විය මේ දුක බැහැ නොවැ දරන්නට



## සලයි! මා යක්ක පුත්‍රය

### මංජුල වෙඩිවර්ධන

ළපැටි සමයෙහි පැමිණ හිත පුරා නියතුඩින් නම ලිව්ව
තුරඟහිස අතගගා ලයර තත් බිඳ මිහිරි තනු මැව්ව
වියලි තෙලි තුඩ මතට සිලිටි හසරැල්ලකින් පණ පෙව්ව
සිහින සිතුවම් දෙණිය සැරි සරන සුකුමාර මුවපොව්ව

මුදු අතිනි හදවතිනි රැලි වැටුණු කොපුල් තල අතගෑව
නද වෙමිනි ඇති පදම් මධු ඔඩම් මැද පිහිනමින් නෑව
මධු මතිනි සිතුවමිනි ඇදවැටී නැඟිටින්න අත පෑව
පුතුනුවනි මෙ අසන්න පුතකු නැති හදවතක පිළිරාව

"යක්ක පැටවකු" ලෙසින් නම තියන තරම් දඟකළ යි
දැක්ක දා සිටම පුතනුවක ලෙස මා දිහා බලයි
සක්ක පැහැ නැතුව මා ඇඳි ඇසින් කඳුළු බිඳු ගලයි
දුක්ඛ සත්‍යය අසල අගසව්ව වෙන කවුරු වෙද් සලයි

අන්තරාවක් තමයි ස්නේහයක් ගැන ඇකෙෂන ආරංචි
"තෙම්පරා" ගැන කියන දහජරා කතාවන් නෑහිච්චි
අන්ධකාරය ගලන මද්යහ්න වෙලාවක රෑ වෙච්චි
වන්දනා පින්තාරු රූ මවන මං තමා ඩාවින්චි

දරුවෙක් වගේ දැනෙන "යක්සයෙකු" වැළඳ ගන්නට බැරිද
සොයුරෙක් වගේ ළඟට අරන් හිත අවුලුවන්නට බැරිද
මිතුරෙක් වගේ කරට අතදාන ඇවිද යන්නට බැරිද
මනුසත් කමේ ගැඹුර සසඟෙහි හොයා වෙහෙස වෙනු හරිද?

ජීවිතේ බැප්තිස්ත කළ යක්ක පැටවාට අඩගසමි
යොර්දාන් ගඟඉවුර පොප්ලර් ගසක හෙවන සතපවමි
පුත්‍ර ස්නේහය රැඳුණු මන්දහාසෙක වර්ණ මුසුකරමි
සංයුක්ත සිත්තමක් බැප්තිස්ත යොහොනුවනී රුව තබමි

මොන තරම් වෙහෙසයිද පුතුනි මේ "නිරූපක" චර්යාව
ඉතිනි මේ සකල සිත්තම් ඇඹුම් රූ ඔබට පර්යාය
අප දෙදෙන මත හෙළන අඩයාලමෙකි රුදුරු ගර්භාව
ඉවසන්න පුතනුවනි වරනැගෙනු ඇත හිතේ ශ්‍රද්ධාව

සැහැසි ඇස් වේදනාවන් කළම්බන නමුදු හිත පතුළ
වහසි බස් දොඩන නුවරුන් මගැර ඔබ මවන පිය තෙපල
ධ්‍යාන වෙස් ගෙන රඳන නුඹ අසල, රළ නඟන විල නිසල
"නාසිසස්" යක් පැටව වසඟයට නොගනු මැන වත කමල

කැරලි කෙහෙරැලි දිගැර පිට මතින් කියඹු අත්හැරියා ම
සොඳුරු යක් පැටවෙක්ට ගැහැණියක මඳහාස එනවාද
"මොනා ලීසා" නමින් පුතුනි මා ඔබව නම් කෙරුවාට
උඹ තවම නිය ළෙලවගෙන පනින සොඳුරු යක් පැටවාය

මිලානෝ නුවර මතු හීයකට පපුව දෙන බව දනිමි
ගිලානව නොයන ඔය මතක වත විසුළ තෙලි තුඩ දරමි
කලාබර සඳට අවනත වෙමින් ගගනතෙහි සැරි සරමි
සදාකාලික සිහින සිත්තමක නුඹ ඉතිරිකර තබමි

## මා ඉම්

### පී.එම්.පතිරණ

ඉදුණු කොසේ
බුදින ලෙසේ
සියොත් රෑන්
පෙරහැරසේ

මායිම් නෑ
පරවෙනි නෑ
අරෝ අවුල්
කොරෝද නෑ

එකම මදුල
දෙකට පලා
ඌට හොටයි
මූට හොටයි

මේ මහ ඉම
කිමද මෙහෙම
ඔබ සහ මම
අතර මැදම

අරෝ අවුල්
පරවෙනි මැද
පොරෝ පහර
උරුමව තද
මිනිසත් කම මියැදුනු සඳ

විසිරුණු පත්
ගොන්නක් යට
විෂ දළ මුව සගවාගෙන
යළි ඉපදී
මග රැකගෙන